සියලුම හිමිකම් ඇවිරිණි.

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Southern Provincial Department of Education**

අ. පො. ස. (උසස් පෙළ) - තෙවන වාර පරීක්ෂණය - 2021
**G. C. E. (Adv. Level) - Second Term Test - 2021**

| | | | | | |
|---|---|---|---|---|---|
| **බෞද්ධ ශිෂ්ටාචාරය - I,II**<br>**Buddhist Civilization - I,II** | **45** | **S** | **I,II** | 13 ශ්‍රේණිය | **පිළිතුරු**<br>**Answer** |

I පත්‍රය

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | - | 2 | 11 | - | 5 | 21 | - | 3 | 31 | - | 3 | 41 | - | 1 |
| 2 | - | 2 | 12 | - | 3 | 22 | - | 1 | 32 | - | 1 | 42 | - | 5 |
| 3 | - | 3 | 13 | - | 4 | 23 | - | 5 | 33 | - | 1 | 43 | - | 4 |
| 4 | - | 3 | 14 | - | 2 | 24 | - | 3 | 34 | - | 3 | 44 | - | 5 |
| 5 | - | 2 | 15 | - | 4 | 25 | - | 1 | 35 | - | 1 | 45 | - | 5 |
| 6 | - | 2 | 16 | - | 3 | 26 | - | 1 | 36 | - | 3 | 46 | - | 4 |
| 7 | - | 4 | 17 | - | 4 | 27 | - | 2 | 37 | - | 5 | 47 | - | 5 |
| 8 | - | 5 | 18 | - | 2 | 28 | - | 2 | 38 | - | 4 | 48 | - | 4 |
| 9 | - | 2 | 19 | - | 3 | 29 | - | 1 | 39 | - | 2 | 49 | - | 4 |
| 10 | - | 5 | 20 | - | 1 | 30 | - | 5 | 40 | - | 4 | 50 | - | 1 |

(ලකුණු 2x50 = 100)

II පත්‍රය
I කොටස

(1) i. ඉගැන්වීම, ඉගෙනීම, යාගකිරීම, යාග කරවීම, දන්දීම, දන් පිළිගැනීම යන කරුණුවලින් හතරක් නම් කිරීම
(ලකුණු 2 යි)

ii. * සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය පිළිගැනීම
* වේද ග්‍රන්ථ පරම සත්‍ය ලෙස පිළිගැනීම
* යාගය ලෞකික ලෝකෝත්තර සැප පිණිස ඒකායන මාර්ගය ලෙස පිළිගැනීම
* අගාරික ප්‍රතිපදාව අගය කිරීම
* පුද්ගලයාගේ උසස් පහත් බව ජන්මය අනුව තීරණය කිරීම
* කාන්තා නිදහස අහිමි කිරීම
* වර්ණ ධර්ම, ආශ්‍රම ධර්ම ආදිය දිව්‍යමය ප්‍රභවයකින් දැක්වීම (ලකුණු 3 යි)

iii. * මාතා පිතා දිසා පුබ්බා - දෙමාපියන් පූර්ව දිසාව ලෙස දැක්වීම
* මාතා පිතු උපට්ඨානං - දෙමව්පියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් ලෙස දැක්වීම
* සතර බ්‍රහ්ම විහරණයෙන් යුතු දෙමාපියන් බ්‍රහ්ම, පූර්වාචාර්ය ආහුනෙය්‍ය ආදී ගුණයන්ගෙන් යුක්ත බව දැක්වීම
* වයස්ගත දෙමාපියන්ට නොසැලකීම පරාභව හා වසල ධර්ම ලෙස පරාභව හා වසල සූත්‍රවල දැක්වීම
* සිඟාලෝවාද සූත්‍රයේ දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතු යුතුකම් දැක්වීම
* මව පියා ඝාතනය ආනන්තරීය පාපකර්මයක් ලෙස දැක්වීම

(කරුණු 4 ට ලකුණු 4 යි)

iv. * රජගහනුවර මගධයේ අගනගරය විය
* බිම්බිසාර, අජාසත්ත රජවරු බුද්ධකාලීන පාලකයන් විය
* වේභාර, වේපුල්ල, ගිජ්ජකූට, ඉසිගිලි, පාණ්ඩව යන පර්වත පහකින් වට වී තිබීම නිසා "ගිරිබ්බජ" නමින් හැඳින්විය
* විවිධ උපක්‍රම තුළින් අධිරාජ්‍යය ගොඩනැගීමට උත්සාහ කළ පැරණිම පාලකයා බිම්බිසාර වේ
* රාජාණ්ඩු පාලනයක් පැවති බව
* බුදුරදුන් සමග සබඳතා පැවත්වූ බව (ප්‍රමාණාත්මක පිළිතුරකට ලකුණු 5 යි)

v. * දී.නි. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව අකිරියවාදියෙකි
* සියතින් කරන්නාට ද අනුන් ලවා කරවන්නාට ද අනුන්ගේ අත්පා සිඳින්නාට ද, සිඳවන්නාට ද, අනුන් දඬුවමින් පෙළන්නාටද, පෙළවන්නාට ද පවක් සිදු නොවන බව පූර්ණ කස්සප සඳහන් කරයි. සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් කළද ඒ හේතුවෙන් සිදුවන පාපයක් නැතැයි ඉගැන්වූ බව. ගංගානම් ගඟේ දකුණු කෙළවර දක්වා යමින් හමුවන සියලු ප්‍රාණීන් මරමින් මරවමින්, සිඳමින්, සිඳවමින් ගමන් කළද එයින් සිදුවන පවක් නැතැයි ඉගැන්විය.

දන් දෙමින්, දන්දෙවමින්, යාග කරමින්, කරවමින් ගංගා නම් ගඟේ උතුරු කෙළවර දක්වා ගියේ වී නමුත් පිනක් හෝ පිනක පැමිණීමක් ද නැත (නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො) දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් සංවරයෙන්, සත්‍ය වචනයෙන් සිදුවන පිනක් නැතැයි උගන්වන බව, පිනක් හෝ පිනක පැමිණීමක් සිදු නොවන බව උගන්වා ඇත.

(2) i. අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තර පුරිස දම්ම සාරථී, සත්ථාදේවමනුස්සානං, බුද්ධ, භගවා, යන බුදුගුණ දෙකක් නම් කිරීම (ලකුණු 2 යි)

ii. පුබ්බේ නිවාසානුස්සති ඥාණය චුතුපපාත ඥාණය (දිබ්බ චක්ඛු ඥාණය) ආසවක්ඛය ඥාණය (ලකුණු 3 යි)

iii. * දින චර්යාව මහා කරුණා සමාපත්තියට සම වැදීමෙන් ආරම්භ කිරීම.
* සුනීතට පිහිටවීම, සෝපාකට පිහිට වීම, කිසාගෝතමියට පිහිට වීම, රජ්ජුමාලාට පිහිටවීම, පූතිගත්ත තිස්ස තෙරුන්, හත්ථාලවක කුමරු, හඳවතිකා ඇතින්න යනාදීන්ට පිහිටවීම. (ලකුණු 4 යි)

iv. * කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කිරීම * අවබෝධයෙන් ක්‍රියා කිරීම * පොරොන්දු ඉටු කිරීම
* අන්‍යයන්ට උදව් කිරීම * නුවණ මෙහෙයවා ක්‍රියා කිරීම * ඉවසීමේ ගුණය
(ලකුණු 05 යි)

v * දුසිරිතෙන් පිරි සමාජයක මඩ දියෙහි නො තැවරී පවිත්‍රව විකසිත වූ නෙළුමක් මෙන් පිරිසිදු ජීවිතයක් ගත කිරීම පත්මාකාර ජීවිතය බව
* "පුණ්ඩරීකං යථාවග්ගු........." යනාදී ලෙස ද්‍රෝණ බමුණාට මෙය හඳුන්වා දුන් බව
* මාර දූවරු, මාගන්දියා ආදීන්ගේ පෙළඹවීම් හමුවේ බුදුරදුන් විරාගී වූ බව
* ආලවක, අග්ගික භාරද්වාජ, අක්කෝසක භාරද්වාජ ආදී කෝප වූවන් හමුවේ කෝප නොවී සිටි බව
* අටලෝ දහමින් කම්පා නොවීම, කෙලෙස්වලින් ආතුර වූවන් අතර අනාතුරව සිටීම, වෛර කරන්නන් අතර අවෛරීව සිටීම යනාදී කරුණු නිදසුන් ය. (ලකුණු 06 යි)

(3) i. "උට්ඨානවතෝ සතිමතෝ
සුචි කම්මස්ස නිසම්ම කාරිනෝ
සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති" (ලකුණු 2 යි)

ii. නැගී සිටි වීර්ය ඇති, තමා ගැන තමාටම දැනෙන සිහිය ඇති, නිදොස් දේ කරන විමසා බලා, කටයුතු කරන තැන්පත් දැහැමි දිවි පැවතුම ඇති නොපමා පුද්ගලයාගේ කීර්තිය මනාව වැඩේ. (ලකුණු 3 යි)

iii. * ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට,
1. මැනවින් හික්මවීම 2. මැනවින් ඉගැන්වීම 3. සියලු ශිල්ප ශාස්ත්‍ර ලබාදීම 4. මිත්‍ර ජනයාට හඳුන්වා දීම 5. අනාගත ආරක්ෂාව සැපයීම
* ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට,
1. දැක හුනස්නෙන් නැගිටීම 2. උපස්ථාන කිරීම 3. ගුරු බසට සවන් දීම 4. ගුරුවරයාගේ කටයුතු කිරීම 5. හොඳින් ඉගෙනීම (ලකුණු 4 යි)

iv. බාලයන් ඇසුරු නොකිරීම, පණ්ඩිතයන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම, සුදුසු ප්‍රදේශයක වාසය කිරීම, මනා සේ සිත පිහිටුවා ගැනීම, ශිල්පයෙහි දක්ෂ බව ආදී ලෙස මහා මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු පහක් නම් කර කෙටියෙන් පැහැදිලි කිරීම ප්‍රමාණවත් ය. (ලකුණු 05 යි)

v. ධර්මයට අකමැති වීම, අසත් පුරුෂයන් ප්‍රියවීම, සත්පුරුෂයන් ප්‍රිය නොකිරීම, අසත් ධර්මය ප්‍රිය කිරීම, නිතර නිදන සුළු බව, උත්සාහයෙන් තොරවීම, අලසකම, ක්‍රෝධ කිරීම, මහලු දෙමාපියන්ට නොසලකා හැරීම යනාදී ලෙස පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ කරුණුවලින් හයක් නම් කර එමගින් පුද්ගල හා සමාජ පරිහානිය සිදුවන ආකාරය පැහැදිලි කළ යුතුයි. (නම් කිරීම ප්‍රමාණවත් නොවේ) (ලකුණු 06 යි)

## II කොටස

(4) i. පංචසීලය, දස රාජ ධර්මය, දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය, ලෝක පාලක ධර්ම සහ කූටදන්ත සූත්‍රගත දේශපාලන මූලධර්ම ආදිය ගැන අවධානය යොමු කරමින් එමගින් ජනහිතකාමී පාලනයක් සකස් වන අයුරු පැහැදිලි කිරීම අවශ්‍ය වේ. (ලකුණු 10 යි)

ii. දස අකුසල්වලින් වෙන්ව දස කුසල්වලට යොමුවීමෙන් මෙලොව පරලොව යහපත සිදුවන ආකාරය විස්තර විය යුතුය. ප්‍රාණඝාතයෙන් වෙන්වීම, අදත්තාදානයෙන් වෙන්වීම, කාම මිථ්‍යාචාරයෙන් වෙන්වීම, මුසාවාදයෙන් වෙන්වීම, පිසුනාවාචයෙන් වෙන්වීම, සම්ඵප්‍රලාපයෙන් වෙන්වීම, අභිද්‍යාවෙන් වෙන්වීම, ව්‍යාපාදයෙන් වෙන්වීම,මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන්වීම ආදිය මගින් මෙලොව පරලොව යහපත සිදුවන ආකාරය ප්‍රමාණාත්මකව විග්‍රහ කර ඇත්නම් සුදුසු පරිදි ලකුණු දෙන්න. (ලකුණු 10 යි)

(5) i. * අඩු බලාපොරොත්තු ඇති බව අල්පේච්ඡතාවයයි
* බොහෝ සැප සම්පත් අපේක්ෂා නොකර අවම පරිභෝජනයෙන් තෘප්තිමත් වීමයි.
* ලද පමණින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය කළ හැකිවීම, කටයුතු බහුල නොවීම, සැහැල්ලු දිවි පැවැත්ම, සරල පැවතුම් ඇති බව, ඉන්ද්‍රිය සංවරය ආදී කරුණු මගින් කෙනෙකුගේ අල්පේච්ඡ බව පෙන්නුම් කරයි.

* බෞද්ධ භික්ෂු සමාජය අල්පේච්ඡ බවට ආදර්ශයකි
* වැඩි බලාපොරොත්තු (මහිච්ඡතාවය නිසා) ඇතිවන සමාජ ප්‍රශ්න හා පුද්ගල පරිහානිය වර්තමානයේ දැකිය හැකිය. ඒවායින් මිදීමට අල්පේච්ඡතාව ඉවහල් වේ.
* කාලීන වශයෙන් මෙහි වැදගත්කම පැහැදිලි කළ යුතුය. (ලකුණු 10 යි)

ii.
* තෙරුවන් කෙරෙහි ඇතිවන පැහැදීම ශ්‍රද්ධාවයි.
* බෞද්ධ ශ්‍රද්ධාව ආකාරවතී ශ්‍රද්ධාව හා අමූලික ශ්‍රද්ධාව ලෙස දෙයාකාර වේ.
* අමූලික ශ්‍රද්ධාව හුදු විශ්වාසය, භක්තිය ආදී මනෝභාවයන්ට සමාන වේ.
* අවබෝධයෙන් යුතුව ඇතිවන පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාව වන අතර එය බුදුදහමින් අගය කරයි.
* බෞද්ධ විමුක්ති මාර්ගය ශ්‍රද්ධාවෙන් ආරම්භ වී ප්‍රඥාවෙන් අවසන් වන බව
* නිවන් අවබෝධය සඳහා ශ්‍රද්ධාව මූලික අවශ්‍යතාවයක් බව ආදී කරුණු මගින් විස්තර විය යුතුය. (ලකුණු 10 යි)

(6) i. "චරථ භික්ඛවේ චාරිකං" යනාදී වශයෙන් ප්‍රථම රහත් හැටනම අමතා බුදුරදුන් කරන ලද මගපෙන්වීම අනුව බුද්ධ කාලීන ධර්ම ප්‍රචාරක සේවාව ආරම්භ කිරීම.
* අස්සජි තෙරුන්ගේ මැදිහත් වීමෙන් උපතිස්ස, කෝලිත වැනි පිරිස් සසුනට එක්වීම.
* බිම්බිසාර රජු ප්‍රථම ආරාම පූජාව වන වේළුවනාරාමය පූජා කිරීම.
* කිඹුල්වත්නුවර ශාක්‍යයන් විසින් නිග්‍රෝධාරාමය පූජා කිරීම.
* මහා කච්චායන හිමියන් අවන්තියේ ධර්ම ප්‍රචාරය කිරීම මගින් විවිධ පුද්ගලයන් සසුන්ගත වීම.
* සුනාපරන්තයට වැඩම කළ පුණ්ණ තෙරුන්ගේ ධර්ම ප්‍රචාරක සේවාව.
* පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් නිසා උදේන රජු බුදුදහම වැළඳ ගැනීම.
* නන්ද කුමරු, රාහුල කුමරු ආදී ශාක්‍යයන් පැවිදිව ශාසනාභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම.
* කෝසල, බිම්බිසාර, සුද්ධෝදන ආදී රජවරු මෙන්ම අනේපිඬු, ඝෝෂිත, කුක්කුට, පාවාරික, බරණැස් සිටු තුමා ආදී සිටුවරුන්ගේ දායකත්වය මෙන්ම කෝසල මල්ලිකා, විශාඛා ආදී දායිකාවන්ගේ අනුග්‍රහය ලැබීම.
* සැරියුත්, මුගලන් අගසවු දෙනම තම පවුලේ සාමාජිකයන් හා ඥාතීන්ද සසුන් ගත කිරීමට ක්‍රියා කිරීම.
* කොණ්ඩඤ්ඤ තෙරුන් දෝණවත්තු ප්‍රදේශයට වැඩමකර තම ඥාතීන් ඇතුළු බොහෝ පිරිස් සසුන් ගත කිරීමට ක්‍රියා කිරීම.
* විවිධ තනතුරු ප්‍රදානය කිරීම හා එම රහතන් වහන්සේලා විවිධ ප්‍රදේශවල ධර්ම ප්‍රචාරයේ නියැලීම. (ලකුණු 10 යි)

ii.
* අශෝක අධිරාජ්‍යයා බෞද්ධයකු වීමෙන් පසු බුදු සසුනට විශේෂ වරප්‍රසාද ලැබෙන්නට විය.
* අන්‍ය තීර්ථක පිරිස් බුදු සසුනේ පැවිදි වී විවිධ ලාභ සත්කාරවලට ගිජු වෙමින් ගත කිරීම නිසා ශාසනයේ විනය පිරිහීමක් ඇතිවිය.
* සිල්වත් භික්ෂූන් දුසිල්වතුන් සමග විනයකර්ම කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා වසර 7 ක් විනය කර්ම නොකිරීම.
* ඇමතිවරයකුගේ ක්‍රියාකලාපය මත භික්ෂූන්ගේ හිස ගසා දැමීම.
* මොග්ගලී පුත්ත තිස්ස හිමියන් හා ධර්මාශෝක රජු අතර සාකච්ඡාවලින් පසු ධර්ම සංගායනාවකට පසුබිම සැකසීම.
* බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු පැළලුප්නුවර අශෝකාරාමයේ දී තෙවන ධර්ම සංගායනාව පැවැත්වීම.

තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ලෙස,
* මොග්ගලීපුත්ත තිස්ස හිමියන් පරවාද මත 500 ක් ඛණ්ඩනය කරමින් හා සකවාදි මත 500 ක් උද්දීපනය කරමින් කතාවත්ථුප්පකරණය රචනා කිරීම මගින් අභිධර්ම පිටකය සම්පූර්ණ වීම.
* හැට දහසක් දුසිල්වතුන් සසුනෙන් නෙරපීම.
* දේශීය වශයෙන් ධර්මය ප්‍රචාරය කිරීම.
* ආරාම වෙහෙර විහාර ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම.
* දේශීය විදේශීය ධර්ම ප්‍රචාරය සිදුකරමින් නව රට සසුන් පිහිටුවීම යන කරුණු තෙවන ධර්ම සංගායනයෙන් සිදු වූ ප්‍රතිඵල වන අතර ඒ තුළින් බුදු දහමේ චිරස්ථිතිය සිදු වූ ආකාරය විස්තර විය යුතුය. (ලකුණු 10 යි)

(7) i.
* බුදුදහමට අනුව ධනය ගොඩගසා යුත්තක් නොව සංසරණය විය යුත්තකි.
* උපයන ධනයෙන් තමා පිනවීම, දෙමාපියන් පිනවීම, අඹු දරුවන් පෝෂණය කිරීම, හිත මිත්‍රාදීන් පිනවීම, දැසි දස් කම්කරුවන් පිනවීම, මහණ බමුණන් විෂයෙහි දක්ෂිණාවන් ලබාදීම.
* පත්කම්ම සූත්‍රයේ පංච බලි සංකල්පය අනුව දැහැමි ව උපයන ධනය සමාජ යුතුකම් ඉටු කිරීම සඳහා යෙදවිය යුතු බව
* ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයේ සඳහා සමජීවිකතාවෙන්, මනා කළමනාකාරිත්වයකින් යුතුව ධනය පරිහරණය කිරීම.
* සිඟාලෝවාද සූත්‍රයට අනුව ඒ කේන භොගේ භුඤ්ජෙය්‍ය........" යනාදී ක්‍රමයට උපයන ධනය කොටස් හතරකට බෙදා ආයෝජනය, පරිභෝජනය හා සංරක්ෂණය සඳහා නුවණින් යෙදවිය යුතු බව
* සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන යුතුකම් ඉටුකිරීමට යෙදවීම.

සුරාව සූදුව කාම මිථ්‍යාචාරය වැනි සමාජයට හානි වන දුෂ්චරිත සඳහා උපයාගත් සම්පත් නොයෙදවීම. (ලකුණු 10 යි)

ii.
* උත්සාහයෙන් හා අනලස්ව ක්‍රියා කිරීමෙන් දියුණුව සිදුවන අතර ඒ සඳහා ශ්‍රමය යෙදවිය යුතු බව
* ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයේ උට්ඨාන සම්පදාව අගය කර ඇති බව
* තම ශ්‍රමය ධාර්මික ජීවිකා වෘත්තීන්හි යෙදවිය යුතු බව
* සෙදා වක්ඛිත්තා ධම්මිකා ධම්ම ලද්දා ..........
* සාහසික ක්‍රියාවල නොයෙදී අසාහසිකව ධාර්මිකව ශ්‍රමය යෙදවිය යුතු බව
* අදැහැමි රැකියාවලින් වෙන්ව, දැහැමි රැකියාවල යෙදිය යුතු බව
* සිඟාලෝවාද සූත්‍රයේ සේව්‍ය සේවක යුතුකම් තුළ ශ්‍රමය අගය කළ බව
* දුගී බවින් තොරවීමට ශ්‍රමය කැප කළ යුතු බව (ලකුණු 10 යි)

(8) a * තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස තම රට සසුන් පිහිටුවීමේ දී ස්වර්ණ භූමියට වැඩම කළ සෝණ, උත්තර හිමිවරු විසින් තායිලන්තයට බුදු සමය හඳුන්වා දී ඇති බව
* යුග හතරක් ඔස්සේ තායිලන්තයේ බුදුසමය ව්‍යාප්ත වූ බව
* රාජ්‍ය පාලකයා බෞද්ධයෙකු වූ බව
* රාජ්‍ය ආගම බුදු දහම බවට පත්වීම
* තාවකාලික පැවිද්ද විශේෂ වූ අතර උපැවිදි වීම උත්සවාකාරයෙන් සිදුකිරීම
* උපැවිදි සහතිකයට විශේෂ ඇගයීමක් ඇති බව
* ආරාමය ප්‍රජා මධ්‍යස්ථානයක් මෙන්ම අධ්‍යාපන මධ්‍යස්ථානයක් වීම
* විවාහ මංගල චාරිත්‍ර භික්ෂූන් වහන්සේලා පිරිත් දේශනා කරන අතරතුරු සිදුකිරීම
* රජුට මල් පූජා කිරීමෙන් පසුව බුදු පිළිමයට මල් පූජා කිරීම
* සියලු ජනතාව කුඩා බුදු රුවක් පළඳනාවක් ලෙස යොදා ගැනීම
* කඨින පිංකම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම
* අවමංගල කටයුතු හා ආදාහන කටයුතු ද ආරාමය තුළ සිදුකිරීම
* දිනපතා පිණ්ඩපාතය පූජා කිරීම

(ලකුණු 10 යි)

b වංශ කතාවලට අනුව ගිරිහඬු සෑය මහියංගනය නාගදීපය, කැළණිය යන ස්ථාන වල ස්තූප පැවති බව,
* පුරා විද්‍යාත්මක සාධක අනුව ලංකාවේ පැරණිම ස්තූපය අනුරාධපුර ථූපාරාම ස්තූපය බව
* මිහිදු හිමියන්ගේ උපදෙස් අනුව දෙවන පැතිස් රජු විසින් නිර්මාණය කළ මෙහි බුදු රදුන්ගේ අකු ධාතූන් වහන්සේ තැන්පත් කර ඇති බව
* දෙවන පැතිස් රජුගේ සොහොයුරු උත්තිය රජු මිහිදු හිමියන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කර අම්භස්ථල ස්තූපය ඉදිකල බව
* දුටුගැමුණු රජු විසින් මිරිසවැටිය දාගැබ හා රුවන්වැලි සෑය ඉදිකරමින් මහා පරිමාණ ස්තූප ඉදිකිරීම ආරම්භ කළ බව
* අනුරාධපුරයේ අභයගිරිය ජේතවනය වැනි විශාල ස්තූප ඉදි කිරීමෙන් පසු පොළොන්නරුවේ ද මහා පරිමාණයේ මෙන්ම මධ්‍ය පරිමාණයේ ස්තූප ඉදිවිය
* ස්තූප ව්‍යාප්තියේ දී විවිධ ආකෘතීන්ට අනුව ඒවා ඉදිකිරීම නිසා පද්මාකාර, ඝණ්ඨාකාර, ඝටාකාර, ධාන්‍යාගාර, බුබ්බුලාකාර, ආම්ලකාකාර යන ආකෘතීන්ට අනුව එහි ගර්භය නිර්මාණය කිරීම
* ස්තූප වන්දනයට ජනතාව යොමු වූ බව
* ශාරීරික චෛත්‍ය වූ ස්තූපය බෞද්ධයාගේ ආධ්‍යාත්මික දියුණුව සංකේතවත් කිරීමට ද යොදාගෙන ඇත.
* පදනම - සුවාසූ දහසක් ධර්මස්කන්ධය
තුන්මහල් පේසාව - ත්‍රිවිධ රත්නය
ගර්භය - සත්තිස් බෝධිපාක්ෂික ධර්මය
හතරැස් කොටුව - චතුරාර්ය සත්‍යය
දේවතා කොටුව - දිව්‍ය ලෝක හෝ සතරවරම් දෙවිවරු
කොත් කැරැල්ල - නවාංග ශාස්තෘ ශාසනය
කොත - නිවන
යනුවෙන් බුදු දහමේ ධර්ම කොටස් විවරණය සඳහා යොදාගෙන ඇතිබව (ලකුණු 10 යි)